# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2019

2023 ජුනි

සමාජීය විද්‍යා පීඨය

ඉතිහාසය

පුරාතන ලෝකයේ ඉතිහාසය - ආසියාවේ සහ යුරෝපයේ ආදිතම ශිෂ්ටාචාර -

**HIST 18214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. 'නව ශිලා යුගය' යනු කුමක්දැයි නිර්වචනය කොට, නව ශිලා යුගයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.

02. ශිෂ්ටාචාරයක මූලික ලක්ෂණ නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

03. සුමේරියානු ශිෂ්ටාචාරයේ පැවති රාජත්වයේ සහ පාලන ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ සාකච්ඡා කරන්න.

04. ඊජිප්තු ශිෂ්ටාචාරය පිළිබඳ හැදෑරීමෙහිලා වැදගත් අභිලේඛන සහ 'ලේඛක වාර්තා' විස්තර කරන්න.

05. ඊජිප්තු ශිෂ්ටාචාරයේ පැවති ආගමික විශ්වාස පිළිබඳ විග්‍රහයක් කරන්න.

06. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ප්‍රභවය සහ කාල නිර්ණය පිළිබඳ පවත්නා විවිධ මතවාද සැකෙවින් සමාලෝචනය කරන්න.

07. චීන ශිෂ්ටාචාරයේ ෂං යුගයේ දේශපාලන, සමාජ හා ආර්ථික සැකැස්ම කෙබඳු වීදැයි සාකච්ඡා කරන්න.

08. ග්‍රීක සංස්කෘතියේ මූලිකාංග පිළිබඳ විග්‍රහයක් කරන්න.

09. රෝම ආණ්ඩුක්‍රම විකාශයේ ප්‍රධාන අවස්ථා පරීක්ෂා කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකක් (02) පිළිබඳ කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

    i. චීනයේ ෂ්සියා රාජවංශය
    ii. හිටයිට් රාජධානිය
    iii. මිනෝවානු ශිෂ්ටාචාරය
    iv. බටහිර රෝම අධිරාජ්‍යයට එල්ල වූ ම්ලේච්ඡ ආක්‍රමණ

***********************************